# කාලයේ සාපේක්ෂබව

පුද්ගලයකු හෝ පුද්ගලයන් හෝ ඇතත් නැතත් ලෝකයක් තිබේය යන්න වාස්තවික යථාර්ථවාදී දර්ශනවල පදනමෙහි වෙයි. මිනිසුන් ජීවත් වුවත් නැතත් පොල් ගෙඩි පොළොවට වැටෙයි. එසේ වැටෙන විට මිනිසුන් සිටියත් නැතත් ඒ වැටෙන්නේ එකම ත්වරණයකිනි. ඒ එකක්වත් මිනිසාගේ මනසට සාපේක්ෂ නොවේ යැයි වාස්තවික යථාර්ථවාදීහු පවසති. මිනිසාට කළ හැක්කේ පොල් ගෙඩි වැටෙනු නිරීක්ෂණය කිරීම ය. එසේත් නැත්නම් පොල් ගෙඩි වැටෙන ත්වරණය මැන ගැනීම ය. නූතනත්වය සමග යුරෝපයෙහි මෙවැනි අදහස් ප්‍රචලිත වන්නට විය. පුද්ගලයන්ගෙන් තොරව පවතින ලෝකයක පුද්ගලයන්ට මෙතරම් තැනක් දීමට බටහිරයන් ක්‍රියා කරන්නේ කෙසේ ද? බටහිරයන්ට අනුව පුද්ගලයන් සමාජයෙන් වෙන් වීමද පුද්ගලයන්ගෙන් ස්වායත්ත ය. එහි තේරුම නම් පුද්ගලයන් ඇතත් නැතත් මිනිසුන් පුද්ගලයන් ලෙස පවතින්නේ ය යන්න නොවන බව බටහිර යථාර්ථවාදීන් පවසනු ඇත. පුද්ගලයන් නැත්නම් මිනිසුන් පුද්ගලයන් ලෙස පවතින්නේය යන්න බටහිර දර්ශනය විසින් මවා ගනු ලැබූ බොරු වාස්තවික යථාර්ථය මගින් නිර්මාණය කෙරුණු විසංවාදයකි. පුද්ගලයන් නැත්නම් පුද්ගලයන්, පුද්ගලයන් ලෙස පවතින්නේ කෙසේ ද?

මෙයට පිළිතුරක් ලෙස බටහිරයන් කියනු ඇත්තේ පුද්ගලයන් වෙන් වෙන් ව ජීවත්වීම පුද්ගලයන්ගෙන්, විශේෂයෙන් ම පුද්ගලයන්ගේ මනසින්, ස්වායත්ත බව ය. අවසානයේ දී ඊනියා වාස්තවික යථාර්ථය පදනම් වන්නේ මනසින් ස්වායත්ත ව ලෝකය පවතින්නේ ය යන්න මත ය. එහෙත් මේ වාස්තවික යථාර්ථවාදීන්ට පිළිතුරු දිය නොහැකි ප්‍රශ්නයක් වෙයි. වාස්තවික යථාර්ථයක් ඇත යන්න ද මනස මත පදනම් වෙයි. එබැවින් මනසින් තොරව, එනම් මනසින් ස්වායත්ත ව ලෝකයක් පවතින බව, මනසින් තොරව එනම් මනස ආධාර කර නොගෙන, පෙන්වන්නේ කෙසේ ද? මේ ප්‍රශ්නයට සතුටුදායක පිළිතුරක් දීමට බටහිරයන්ට නොහැකි ය. මෙරට සිටින වඳ අනුකාරක ඇංකරයන් ගැන කියනුම කවරේ ද? ත්වරණය, පොල් ගෙඩිය ආදිය මනසින් තනා ගනු ලැබූ සංකල්ප මිස වෙනත් වාස්තවික යථාර්ථයක් නොවේ. මෙරට බොහෝ දෙනා සිතා සිටින්නේ ගුරුත්වාකර්ෂණය යනු වාස්තවික යථාර්ථයක් බව ය. එහෙත් එය නිව්ටන් පඬිවරයාගේ නිර්මාණයක් බවත් අයින්ස්ටයින් විද්වතාට අනුව ගුරුත්වාකර්ෂණය යනුවෙන් භෞතික ප්‍රපංචයක් නොමැති බවත් ඔවුහු නොදනිති. සියළු සංකල්ප තනන්නා මනස ය. මනස යන සංකල්පය නිර්මාණය කරන්නේ ද මනස බව මා පෙන්වා දී ඇත. එබැවින් මනසින් තොරව මනසවත් නැත.

කෙසේ වෙතත් ගැලීලියෝ පඬිවරයා බටහිර ලෝකයට ඉදිරිපත් කළ අදහස වූයේ මනසින් තොරව පොල් ගෙඩි පමණක් නොව කාලය යනුවෙන් ප්‍රපංචයක් ද ඇති බව ය. ඔහුට අනුව මේ බොහෝ දෑ මැන ගත හැකිවා පමණක් නොව එසේ මැනගත හැකි දෑ ම සත්‍ය විය. වියුක්ත ව නිරපේක්ෂ ව ඉදිරිපත් කළ හැකි සංකල්ප ඔස්සේ සත්‍ය සෙවීමට බටහිරයෝ ක්‍රමයෙන් පුරුදු වූහ. ගැලීලියෝ පඬිවරයා ඉදිරිපත් කළ අදහස් බටහිර යුරෝපයේ මස්තකප්‍රාප්ත වූයේ දහඅටවැනි සියවසේ දී ය.

ගැලීලියෝ පඬිවරයා වියුක්තය හා නිරපේක්ෂය පිළිබඳ ඉදිරිපත් කළ අදහස් අපි තවදුරටත් විභාග කර බලමු. පළමුවෙන් ම කිවයුත්තේ මේ අදහස් ගලා එන්නේ කතෝලික චින්තනයට විරුද්ධ ව බව ය. කලින් ද සඳහන් කර ඇති පරිදි කතෝලික චින්තනයෙහි දෙවියන් වහන්සේ සංයුක්ත ය. එමෙන් ම එහි උන්වහන්සේ සාපේක්ෂ ය. උන්වහන්සේ මිනිසුන්ට සාපේක්ෂ අයුරින් දැක බලාගත හැකි පරිදි මරිය තුමියගේ කුසින් බිහිවූහ. එහෙත් යුදෙව්වන්ගේ යෙහෝවා දෙවියන් වහන්සේ එසේ නොවේ. යෙහෝවා දෙවියන් වහන්සේ වියුක්ත ය. කිසිවකුටවත් උන්වහන්සේ දැක බලාගත නොහැකි ය. උන්වහන්සේ නිරපේක්ෂ ය. වියුක්ත නිරපේක්ෂ යෙහෝවා දෙවියන් වහන්සේ පරම සත්‍යය වූහ. ගැලීලියෝ පඬිවරයා භක්තිමත් කතෝලිකයකු වුව ද ඔහුගේ ද දායකත්වයෙන් ගොඩ නැගුණු බටහිර විද්‍යාව කතෝලික චින්තනයට වඩා යුදෙව් චින්තනය මත පදනම් විය. මුළු මහත් බටහිර විද්‍යාවේ ම නිරපේක්ෂ වියුක්ත සත්‍යය ගලා එන්නේ යුදෙව් දෙවියන් වහන්සේ හරහා ය.

කාලය මැනීම සඳහා අවලම්බය යොදා ගත හැකි බව පෙන්වීම අප සිතනවාට වඩා බටහිර ලෝකය වෙනස් කිරීමට දායක විය. එතෙක් කාලය මැන්නේ එකිනෙකාට සාපේක්ෂව ය. පැ තැටිය යොදා ගත්ත ද, හෝරා යන්ත්‍රය යොදා ගත්ත ද, පියවර මැන්න ද එහි දැඩි ප්‍රමිතියක් නොවී ය. පැ තැටියේ (උදාහරණයකට ඒ සඳහා පොල් කටුවක් යොදා

© Prof. Nalin De Silva

ගත්තේ නම් පොල් කටුවේ) පරිමාව මෙතෙක් විය යුතු බවට ප්‍රමිතියක් නියම නොකෙරිණි. එහෙත් අවලම්බයෙන් පසු එය එසේ නොවී ය. සරල අවලම්බයට ප්‍රමිති පැනවිය හැකි විය. ඉන් මැනෙන කාලය මනින්නාගෙන් ස්වායත්ත විය. කාලය නිරපේක්ෂ විය. එපමණක් නොවේ. එක් පැත්තකින් දාර්ශනික හා සමාජයීය වශයෙන් කාලය අළුත් අරුත් ලබා ගත්තේ ය. අනෙක් පැත්තෙන් නිරීක්ෂකයාගෙන් ස්වායත්ත යැයි බටහිරයන් විසින් කියනු ලැබූ ප්‍රමිති සෑම ක්‍ෂෙත්‍රයක ම හඳුන්වා දෙනු ලැබිණි. නිරීක්ෂකයා ක්‍රමයෙන් නිරීක්ෂ්‍යයෙන් වෙන් වන්නට පටන් ගත්තේ ය. ඩෙකාට්ෙ නම් ප්‍රංශ දාර්ශනිකයා මේ වෙන් කිරීම ඉහළ ම තලයට ගෙනාවේ ය.

අද ලෝකයේ ප්‍රමිති නැති තැනක් නැත. මේ ප්‍රමිති ඉතා දැඩි වෙයි. බටහිර වෛද්‍ය විද්‍යාව මිලි ලීටරවලින්, මිලි ග්‍රෑම්වලින් ඖෂධ නියම කරයි. එය අටපත එකට හිඳුවා කසාය දීමට වඩා වෙනස් ය. අටපතෙහි පත යන්නෙහි පරිමාව කුමක්දැයි නොකියැවෙයි. සාන්ද්‍රණය පිළිබඳ අදහසක් එහි වෙතත් පතේ පරිමාව කුමක් විය යුතු දැයි එහි නොකියැවෙයි. මංචාඩිය, කළඳ ආදියට නිශ්චිත ප්‍රමිති නැත. මදටිය ඇටයේ ස්කන්ධය එකින් එකට වෙනස් විය. ඒ සියල්ල සාපේක්ෂ විය. එහෙත් ප්‍රමිතිගත ඒකක එසේ නොවේ. ඒවා නිරපේක්ෂ යැයි බටහිරයෝ කීහ. එහෙත් මේ ප්‍රමිති ඉදිරිපත් කරන්නේ බටහිරයන් බව ඔවුහු අපටවත් තමන්ටවත් නොකීහ. ඔවුහු ඔවුන්ගේ ප්‍රමිතිවලට නිරපේක්ෂත්වයක් ලබා දුන්හ. අද වන විට මුළු ලෝකයට ම ප්‍රමිති ඉදිරිපත් කරන්නෝ ඇමරිකානුවෝ ය. ඔවුන් ඉදිරිපත් කරන ප්‍රමිති ඔවුන්ට සාපේක්ෂ ප්‍රමිති මිස නිරපේක්ෂ ප්‍රමිති නොවේ. ඔවුන් අපට නියම කරන ඖෂධවල පිටුපස ඇත්තේ වියුක්ත මිනිසා ය. අහවල් අහවල් මිනිසා නොව ඊනියා සාමාන්‍ය මිනිසා යන සංකල්පයක් එහි වෙයි. යෙහෝවා දෙවියන් වහන්සේ මෙන් ම මේ වියුක්ත මිනිසා ද අපට කවදාවත් කොහේවත් දැකගත හැකි අයකු නොවේ. ඒ කෙසේ වෙතත් මේ වියුක්ත මිනිසා යනු එදා සාමාන්‍ය යුරෝපීය මිනිසා ය. අද නම් සාමාන්‍ය ඇමරිකානුවා ය. අද බටහිර වෛද්‍යවරු සමහර විට ඊනියා ආසියාතික සාමාන්‍ය මිනිසකු වෙනුවෙන් ඖෂධ නියම කරනවා දැයි නොදනිමි. ඒ කෙසේ වෙතත් ඊනියා සාමාන්‍ය මිනිසා යැයි කියනු ලබන වියුක්ත මිනිසකු හරහා දැඩි මිනුමක් සහිතව නියම කෙරෙන ඖෂධවලට වඩා ඒ ඒ පුද්ගලයාට අටපත එකට හින්ද වීමෙහි වැදගත් කමක් ඇති බව පෙනී යයි. අටපත මනිනු ලබන්නේ ගෙදර සාමාන්‍යයෙන් යොදා ගන්නා කෝප්පයකින් හෝ වෙනත් භාජනයකිනි. මේ මිම්ම සිරුරට හුරු වූවකි. එබැවින් අටපත එකට හින්ද වීමෙහි දී මිම්ම ගෙදරින් ගෙදරට වෙනස් විය හැකි වුව ද, ඒ ඒ අයට හුරු සාපේක්ෂ මිනුමක් එහි දී යොදා ගැනෙයි.

පෙරදිග සංගීතයෙහි ද මෙවැනි තත්වයක් දක්නට ඇත. එහි දැඩි ප්‍රමිති නැත. එහෙත් බටහිර සංගීතය එසේ නොවේ. බටහිර සංගීතඥයකු විසින් ලියන ලද සංගීත ඛාණ්ඩයක් වාදනය කිරීමේ දී වාදකයාට ලැබෙන නිදහසක් නැත. එයට හේතුව සංගීතය නිර්මාණය කරන ලද සංගීතඥයා එය මුළුමනින් ම මෙන් නිර්මාණය කර තිබීම ය. එහෙත් පෙරදිග සංගීතයෙහි එසේ නොවේ. වාදකයාට රාගයක් වාදනය කිරීමෙහි දී ද යම් නිදහසක් ඇත. රාගයක වාදනය වාදකයාට සාපේක්ෂ වෙයි. වෙදකමේ සංගීතයේ පමණක් නොව වෙනත් ක්‍ෂෙත්‍රවල ද මේ සාපේක්ෂතාවය පෙරදිග දක්නට ඇත. නාට්‍ය පිටපත වුව ද පෙරදිග වෙනස් වෙයි. කොහොඹා කංකාරිය සඳහා අලිඛිත නාට්‍ය පිටපත් විශාල සංඛ්‍යාවක් ඇතැයි සිතමි. මේ නාට්‍ය පිටපත්, එකිනෙකා විසින් පාඩම් කරනු ලැබීමේ දී ඇති වූ දෝශ නොව කොහොඹා කංකාරිය රඟ දැක්වීමේ දී ඇති වූ වෙනස්කම් නිසා අපට හිමි වී ඇති නාට්‍ය පිටපත් ය. මේ පිටපත්වලින් එකක් පමණක් සම්මතයක් ලෙස ගැනීම අපේ සම්ප්‍රදායට අනුකූල වූවක් නොවේ. අපේ ප්‍රවාද ගොඩ නැගීමේ දී මේ සාපේක්ෂ බව තබා ගැනීම තරමක් දුරට හෝ කළ යුතු වෙයි. කොහොඹා කංකාරියේ පිටපත් එකක් නොව රාශියක් ම පාඨකයන් අතට පත් කළ යුතු ය.

කාලය මැනීම සඳහා ඊනියා වාස්තවික මිම්මක් ඇති කරනු ලැබීමත් සමග කාලයේ සාපේක්ෂ බව නැති වී යාමට පටන් ගත්තේ ය. ගැලීලියෝ විද්වතා බටහිරට සාපේක්ෂ චලිතය හඳුන්වා දුන් පුද්ගලයා බව කලින් සඳහන් කෙරී ඇත. එමෙන් ම ඔහු හඳුන්වා දුන් සාපේක්ෂතාවයෙහි නිරපේක්ෂ බවක් වූ බව ද කීවෙමි. ඔහුගේ සාපේක්ෂතාව දෙන ලද යම් දෙයක්, එනම් නිරපේක්ෂව ඇති දෙයක්, එක් එක් නිරීක්ෂකයාට සාපේක්ෂව පෙනෙ ආකාරය පිළිබඳ ව වූ සාපේක්ෂතාවක් විය. ඒ සාපේක්ෂතාවයෙහි වියුක්ත නිරපේක්ෂ සත්‍යයක් විය. චලිතය සම්බන්ධයෙන් ගැලීලියෝ පඬිවරයා කීවේ අපට වස්තුවක් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ හැක්කේ එහි අපට සාපේක්ෂ වූ චලිතය පමණක් බව ය. වස්තුවේ නිරපේක්ෂ චලිතය අපට නිරීක්ෂණය කළ නොහැකි වුව ද ඒ නිරීක්ෂණය කළ හැකි අයෙක් වෙති. ඒ දෙවියන් වහන්සේ යැයි ගත හැකි ය. කාලයේ සාපේක්ෂතාවය නැති කිරීමෙන් ගැලීලියෝ පඬිවරයා කාහටත් පොදු

© Prof. Nalin De Silva

කාලයක් නිර්මාණය කළා පමණක් නොව ඒ පොදු කාලය මනින ආකාරය ද කියා දුන්නේ ය. එවිට කාලය නිරීක්ෂකයාගෙන් ස්වායත්තව තිබෙන නොහොත් ගලා යන දෙයක් බවට පත් වෙයි.

මේ නිරපේක්ෂ වූ කාලය නිව්ටන් පඬිවරයාට ප්‍රයෝජනවත් විය. ඔහු තම චලිත නියම සූත්‍රගත කිරීමේ දී මේ නිරීක්ෂකයාගෙන් ස්වායත්ත ව ගලා යන නිරපේක්ෂ කාලය යන සංකල්පය යොදා ගත්තේ ය. අප කලින් කියා ඇති පරිදි අයින්ස්ටයින් පඬිවරයා වුව ද, තම සාපේක්ෂතාවාදයෙන් නිරපේක්ෂතාව අත් නොහැරියේ ය. ඔහු නිරපේක්ෂ කාලය වෙනුවට නිරපේක්ෂ අවකාශ - කාලය යන්න ඉදිරිපත් කෙළේ ය. අද පවා බටහිර සිටින පශ්චාත් නූතනවාදීන් යැයි කියා ගන්නවුන්ට ද නිරපේක්ෂතාව මුළුමනින් ම අත්හැර දැමීමට නොහැකි වී ඇත. ඔවුන්ට ලෝකයෙහි විශාල කොටසක් භාෂාව විසින් නිර්මාණය කරනු ලැබූ සාපේක්ෂ වූවකි. එහෙත් භාෂාව විසින් නිර්මාණය කරනු නොලැබූ කොටසක් ද වන බව ඔවුහු විශ්වාස කරති. ඔවුන්ගේ ඊනියා පාර භෞතිකය භාෂාවේ නිර්මාණයක් සේ සැලකිය හැකි යැයි සිතමි. එසේ නොසලකන්නේ නම් පාර භෞතික නොවන දෑද, එනම් භෞතික දෑද, භාෂාව විසින් නිර්මාණය කෙරෙන්නේ යැයි ගම්‍ය වෙයි. එවිට භාෂාව යනු කුමක් ද යන ප්‍රශ්නයට දෙන පිළිතුරුවල විසංවාද දැක ගත හැකි වනු ඇත. කෙසේ වෙතත් පාර භෞතික නොවන භෞතිකයක, වාස්තවික භෞතිකයක, පැවැත්ම පිළිබඳ විශ්වාසය (එය විශ්වාසයක් මිස අන් දෙයක් නොවෙ) බටහිරයන්ට අත් හැරිය නොහැකි ය. මේ විශ්වාසය  තිබෙන තාක් බටහිරයන්ට බංකොළොත් දර්ශන හැරෙන්නට වෙනත් දර්ශනයක් ගොඩ නගා ගත නොහැකි ය. ඊනියා පශ්චාත්නූතනවාදී දර්ශන බංකෙළොත් දර්ශන බව මෙරට සිටින පශ්චාත්නූතනවාදී ඇංකර අනුකාරකයන්ට නම් සම්ම ජාතියේ නොවැටහෙනු ඇත.

කාලය යනු කිසිසේත්ම නිරපේක්ෂ වන්නක් නොවන බව ථෙරවාදයෙහි පිළි ගැනීම වෙයි. මේ සම්බන්ධයෙන් අත්ථසාලිනියෙහි බුද්ධඝෝෂ තෙරුන් වහන්සේ දේශනා කර ඇති දෑ අපට වැදගත් වෙයි. එහි සඳහන් වන්නේ කාලය යනු හුදෙක් පඤ්ඤත්තියක් පමණක් බව ය. අනෙක් ඉන්ද්‍රිය සමග සම්බන්ධයක් නැතිව මනස නම් ඉන්ද්‍රිය පමණක් යොදා ගෙන අත් විඳින්නකට පඤ්ඤත්තියක් යැයි කිව හැකි යැයි සිතමි. කාලය යන්න පොල් ගෙඩිය වැනි දෙයක් නොවේ. පොල් ගෙඩිය යන සංකල්පය ද මනසින් නිර්මාණය කරන්නේ වුව ද, ඇස, ස්පර්ශේන්ද්‍රිය ආදිය නැතිව පොල් ගෙඩිය යන සංකල්පය නිර්මානය කළ නොහැකි ය.  එහෙත් කාලය යන්න එසේ නොවේ. එය මනසින් පමණක් නිර්මාණය කළ හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva